

# Solar Homes වැඩසටහන

Solar Homes වැඩසටහන මගින් වික්ටෝරියානු වැසියන් සිය බලශක්ති බිල්පත් සම්බන්ධ පාලනය සියතට ගැනීම, රැකියා උත්පාදනය කිරීම, දේශගුණික විපර්යාසවලට එරෙහිව කටයුතු කිරීම සහ සියළුම වික්ටෝරියානු වැසියන් සඳහා වඩා පිරිසිදු සහ යහපත් අනාගතයක් ඇතිකිරීම සිදු කරයි.

## සූර්ය බල පද්ධතියක් ස්ථාපනය කරන්නේ ඇයි?

- ඔබගේ බලශක්ති බිල්පත් අඩුකර ගැනීම
- ඔබගේ බලශක්ති සැපයුම වැඩිකර ගැනීම
- සූර්ය බලශක්ති කර්මාන්තයේ රැකියා 5,500 ක් ඇතිකර ගැනීමට උපකාර කිරීම
- දේශගුණික විපර්යාසවලට එරෙහිව කටයුතු කිරීම

## වැඩසටහන සම්බන්ධයෙන්

Solar Homes වැඩසටහන මගින් වික්ටෝරියානු වැසියන් සිය බලශක්ති බිල්පත් සම්බන්ධ පාලනය සියතට ගැනීම, අළුත්කල හැකි බලශක්ති යොදා ගැනීම සහ සියළුම වික්ටෝරියානු වැසියන් සදහා වඩා පිරිසිදු සහ වඩා යහපත් අනාගතයක් ඇතිකිරීමට උපකාර සිදු කරයි.

වැඩසටහන මගින් සූර්ය බලශක්ති පැනල් (solar panels (PV)), සූර්ය බලශක්ති උණු ජලය සහ සූර්ය බලශක්ති බැටරි සඳහා වට්ටම් මගින් සූර්ය බලශක්තිය ලබා ගැනීම පහසු කිරීම ඇතුළු සූර්ය බලශක්ති පැනල් (PV) සඳහා පොලී රහිත ණය ඇතුළු නව දිරි දීමනා ලබාදේ.

ඔබ වෙනුවෙන් ඔබගේ සූර්ය බලශක්ති සිල්ලර වෙළෙන්දා වට්ටම ලබා ගන්නා අතර එම වට්ටම් මුදල ඔබගේ සමස්ථ පද්ධතියට සහ ස්ථාපන කිරීමට යන වියදමෙන් අඩු කරනු ඇත. ස්ථාපනය කිරීමෙන් පසු ගෙවීමට ඉතිරි සියළු මුදල ඔබගේ සූර්ය බලශක්ති සිල්ලර වෙළෙන්දා වෙත කෙළින්ම ගෙවීම ඔබගේ වගකීමවේ.

### පොලී රහිත ණයක් එකතුකර ගැනීමට අවශ්‍යද?

තවදුරටත් වියදම අඩුකර ගැනීමට, නිවසේ අදිංචිව සිටින අයිතිකරු විසින් සිය සූර්ය්‍ය පැනල් (පී.වී.) වට්ටමේ ප්‍රමාණයට **solar panel (PV) systems**, සඳහා පොලී රහිත ණයකට අයදුම් කල හැකිය. සෝලර් වික්ටෝරියා පොර්ටලය ඔස්සේ වට්ටම් සඳහා වන අයදුම්පත්‍රයේ කොටසක් වශයෙන් ඔබට ණයක් සඳහා ඇති හිමිකම සම්බන්ධයෙන් දැනුම් දෙනු ඇත.

නව අයදුම්පත්‍ර ක්‍රියාවලිය අනුව, වට්ටම සහ ණය ප්‍රමාණය ඔබගේ මුළු පද්ධතියට යන වියදමෙන් අඩු කරනු ඇත, මේ අනුව ඔබ විසින් පද්ධතිය ස්ථාපනය කිරීමෙන් පසුව ගෙවිය යුත්තේ ඉතිරි මුදල පමණක් බවට වගබලා ගැනේ. ඔබගේ සූර්ය්‍ය බලශක්ති සිල්ලර වෙළෙන්දා වට්ටම සහ ණය මුදල ඔබට නැවත ගෙවනු ඇත.

ණය මුදල ගෙවිය යුත්තේ වසර හතරක් පුරාය. **සූර්ය්‍ය බලශක්ති උණු ජල හෝ සූර්ය්‍ය බලශක්ති බැටරි සඳහා ණය මුදල් ලබාගත නොහැක.**

## ලබාගත හැකි වටට්ම්

### සූර්ය බලශක්ති පැනල් (PV) සඳහාවූ වට්ටම්

කුලී නිවෙස් හිමියන් ඇතුළුව සුදුසුකම් ඇති නිවෙස් සඳහා සූර්ය බලශක්ති පැනල් (PV) සඳහා යන වියදම වෙනුවෙන් වට්ටමක් ලබාගත හැකිය.

### කුලී නිවෙස් සඳහාවූ සූර්ය බලශක්ති පැනල් (PV) වට්ටම්

සුදුසුකම් ඇති කුලී නිවෙස් සඳහා සූර්ය බලශක්ති පැනල් (PV) වට්ටම් ලබාගත හැකි අතර ඒ මගින් පුනර්ජනය බලශක්තියෙන් ලැබෙන ප්‍රතිලාභ කුලී නිවැසියන් හට ලබාගත හැකිය.

### සූර්ය බලශක්ති උණු ජල වට්ටම

සුදුසුකම් ඇති නිවෙස්වල සූර්ය බලශක්ති උණු ජල පද්ධතියකට යන වියදම සම්බන්ධයෙන් වට්ටමක් ලබාගත හැකිය.

### සූර්ය බලශක්ති බැටරි සඳහාවූ වට්ටම

සුදුසුකම් ඇති නිවෙස්වල සූර්ය බලශක්ති බැටරියක් සඳහා යන වියදම සම්බන්ධයෙන් වට්ටමක් ලබාගත හැකිය.

බැටරි සඳහාවූ වට්ටම් නියාමක වැඩසටහන මගින් අරමුණු කරන්නේ වික්ටෝරියා ප්‍රාන්තය පුරා නම්කරන ලද පෝස්ට්කෝඩ්හි දැනටමත් සූර්ය බලශක්ති පැනල් ඇතිමුත් සූර්ය බලශක්ති වට්ටම ලබා නොගත් නිවෙස්ය.

Solar Victoria

VICTORIA State Government

# ඔබ ආරම්භ කිරීමට පෙර: වැඩසටහන සඳහා ඇති සුදුසුකම අවබෝධ කර ගන්න

**වික්ටෝරියානු වැසියන් පහත අවශ්‍යතා සපුරාලන්නේ නම්, වට්ටමකට සුදුසුකම් ලබයි:**

| | සූර්ය බලශක්ති පැනල් (PV) වට්ටම | කුලී නිවෙස් සඳහාවූ සූර්ය බලශක්ති පැනල් (PV) වට්ටම | සූර්ය බලශක්ති උණු ජල වට්ටම | සූර්ය බලශක්ති බැටරි වට්ටම |
|---|---|---|---|---|
| අයදුම්කරු පද්ධතිය ස්ථාපනය කරන නිවසේ පදිංචිව සිටින අයිතිකරු විය යුතුය | ✓ | | ✓ | ✓ |
| සියළුම නිවසේ හිමියන්ගේ ඒකාබද්ධ වාර්ෂික බදු ගෙවිය යුතු ආදායම $180,000 ට වඩා අඩු විය යුතුය (ඔබගේ ඕස්ට්‍රේලියානු බදු කාර්යාලයේ ඇගයීමේ දැන්වීම පදනම් කරගෙන) | ✓ | | ✓ | ✓ |
| අදාල දේපළ, පවතින දේපළක් වන අතර මිලියන $3 ට වඩා වටිනාකමින් අඩු විය යුතුය | ✓ | ✓ | ✓ | ✓ |
| දේපළ සතුව දැනට පවතින සූර්ය බලශක්ති පී.වී. පද්ධතියක් නොතිබිය යුතුය (2009 නොවැම්බර් 1 වන දින සිට) | ✓ | ✓ | | |
| Solar Homes වැඩසටහන යටතේ අයදුම්කරු පදිංචිව සිටින අයිතිකරු වශයෙන් වට්ටමක් ලබා නොගෙන තිබිය යුතුය | ✓ | | ✓ | ✓ |
| Solar Homes වැඩසටහන සඳහාවූ ගිවිසුමක් නිවෙස් හිමියා සහ කුලී නිවැසියා (නිවැසියන්) අතර අත්සන්කර තිබිය යුතුය | | ✓ | | |
| සියළුම කුලී නිවැසියන්ගේ ඒකාබද්ධ වාර්ෂික බදු ගෙවිය යුතු ආදායම $180,000 ට වඩා අඩු විය යුතුය (ඔබගේ ඕස්ට්‍රේලියානු බදු කාර්යාලයේ ඇගයීමේ දැන්වීම/දැන්වීම් පදනම් කරගෙන) | | ✓ | | |
| උණු ජල පද්ධතිය ප්‍රතිස්ථාපනය කරන්නේ නම්, එය මිලදී ගත් දින සිට වසර තුනකට වඩා පැරණි විය යුතුය | | | ✓ | |
| දේපළ අළුතින් ගොඩනැගූ එකක් නොවිය යුතුය | | | ✓ | |
| නම්කරන ලද පොස්ට්කෝඩයක් තුල දේපළ පිහිටා තිබිය යුතු අතර කිවො 5 හෝ ඊට වැඩි ධාරිතාවක් ඇති සූර්ය බලශක්ති පී.වී. පැනල් තිබිය යුතුය | | | | ✓ |
| ඔබගේ ජාල බෙදාහරින සේවා සපයන්නාගේ (DNSP ) පූර්ව අනුමැතිය ලබා තිබිය යුතුය | | | | ✓ |
| සංචය විසඳුම අපගේ අනුමත කල බැටරි ලැයිස්තුවේ තිබිය යුතු අතර දේපළ සතුව දැනට බලශක්තිය සංචය කිරීමේ පද්ධතියක් නොතිබිය යුතුය | | | | ✓ |
| අයිතිකරුවා/අයිතිකරුවන් විසින් පහත දේ ලබා ගැනීමට එකඟවේ:<br>• ඔවුන්ගේ ජාල සැපයුම් සේවා සපයන්නා වෙතින් තොරතුරු<br>• තෝරාගතහොත්, නොමිළේ සිදු කරන පරීක්ෂාවක් සහ/හෝ විගණනයක් | | | | ✓ |

**සෑම වට්ටම් ප්‍රවාහයකටම එයට ආවේණිකවූ අවශ්‍යතාවයන් සහ අයදුම්පත්‍ර ක්‍රියාවලියක් ඇත. ඔබ අයදුම්පත් ක්‍රියාවලිය ආරම්භ කිරීමට පෙර solar.vic.gov.au වෙත ගොස් ඒ සම්බන්ධ දැනුවත්වන්න.** ඔබගේ දේපළ සුදුසුකම් සපුරාලන බවට විශ්වාසයෙන් තහවුරුවූ පසු, කුමන සූර්ය බලශක්ති වෘත්තීයකයන් සහ කුමන නිෂ්පාදන වැඩසටහනකට සහභාගිවීමට සුදුසුකම් ලබයිද යන්න සහ කුමන ඒවා ඔබගේ බලශක්ති අවශ්‍යතාවයන් සපුරාලයිද යන්න සොයා බැලීම ආරම්භ කල යුතුය.

## අප හා සමග සම්බන්ධ වන්න

වැඩසටහන සම්බන්ධ වැඩිදුර තොරතුරු www.solar.vic.gov.au වෙතින් හෝ දුරකථන අංක 1300 376 393 ඔස්සේ (කාර්යාලීය වේලාවලදී) අපගේ පාරිභෝගික සේවා කණ්ඩායම ඇමතීම මගින් සොයා ගත හැකිය.

Interpreter

**ජාතික පරිවර්තන සහ තෝල්ක සේවාව (Translating and Interpreting Service): 131 450.**

© වික්ටෝරියානු ප්‍රාන්ත පාරිසරික, ඉඩම්, ජල සහ සැලසුම් දෙපාර්තමේන්තුව 2019

**වගකීම බැහැර කිරීම**
මෙම ප්‍රකාශනය ඔබට උපකාරීවිය හැකි වුවද වික්ටෝරියානු ප්‍රාන්ත සහ එහි සේවකයන් විසින් මෙම ප්‍රකාශනය කිසිදු අඩුපාඩුවලින් තොර බවට හෝ ඔබගේ අරමුණට සම්පූර්ණයෙන්ම උචිත බවට හෝ කිසිදු තහවුරුවක් ලබා නොදෙන බැවින් මෙම ප්‍රකාශනයේ ඇති කිසියම් තොරතුරක් මත විශ්වාසය තැබීම මගින් සිදුවන අලාභයක් හෝ වෙනත් ප්‍රතිවිපාකයක් සම්බන්ධයෙන් සියළු වගකීම් මෙයින් බැහැර කෙරේ.